Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ - තනතුරු පුරප්පාඩු

### බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාතේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.12.08 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, පානදුර පාර, බණ්ඩාරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට සහ මෙම සභාවේ දැනට අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සළකා බලනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *තනතුරු ගණන* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු | Rs. 25, 790- 10x270- 10x300- 10x330- 12x350 - Rs. 38,990 | 01 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම (එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත් වී තිබීම; *සහ*<br><br>පෞද්ගලික/ කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන්වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම (බඳවා ගන්නා දිනට වසර තුනකට (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.); *සහ*<br><br>බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br><br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | තනතුරු ගණන | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 02. | වැඩ ක්ෂේත්‍ර කම්කරු | Rs. 24,250- 10x250 - 10x270x 10x300- 10x330 - Rs. 36,410 | 03 | අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබිය යුතුය. |
| 03. | සෞඛ්‍ය කම්කරු | Rs. 24,250- 10x250 - 10x270 -10x300 - 10x330 - Rs. 36,410 | 04 | අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබිය යුතුය. |

01. ඉහත සඳහන් කරන ලද තනතුර සඳහා අදාළ සුදුසුකම්වලට අමතරව පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**1. පොදු සුදුසුකම්**

I අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03 ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.) ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකයකින් සනාථ විය යුතුය.

II අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2017.12.08 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

III අයදුම්කරු යහපත්/ විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

IV දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

V අයදුම්කරු පරම්පරාවෙන් ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

VI ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05 ක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තා වූ ද, සතුටුදායක සේවා කාලයක් සපුරන අයෙකු විය යුතුය.

VII රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින් තනතුරු සඳහා අයදුම්කිරීමේදී රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

**2. සේවය නියුක්ත කිරීමේ කොන්දේසි**

I මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

II බඳවාගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නේය./ ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු 1 ක වැඩ පරීක්ෂක කාල සීමාවකට යටත් විය යුතුය.

III ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත් දරු/ වැන්දඹු පුරුෂ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

IV මෙම සේවයේ සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ. පළාත් පාලන ආයතනවල ස්ථාන මාරුකිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා සතු වේ. තවද පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම් ඒ ඒ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගේ එකඟතාවය මත පළාත් පාලන කොමසාරිස් විසින් සිදුකරනු ඇත. රාජකාරි වේලාව හා රාජකාරියේ යෙදවීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ප්‍රධානියා රජය පිළිගත් නීතිරීතිවලට යටත්ව තීරණය කළ හැකිවේ.

V මෙම බඳවා ගැනීම සිදුකරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලටද රජය හෝ පළාත් සභාවේ හෝ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වරින් වර නිකුත්කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලවය. ඒ අනුව ක්‍රියා කිරීමට පත්වීම්ලාභීන් බැඳී සිටිය යුතුය.

3. බඳවා ගැනීමේ ක්‍රමය

I බඳවා ගැනීමේ පරිපාටිය අනුව ලිඛිත/ ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක කුසලතාවය මත සුදුසුකම් ලබන අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් සුදුස්සන් තෝරා ගැනේ.

II බඳවා ගැනීමේ පරිපාටීන්ට අනුව ලිඛිත/ ව්‍යුහගත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් නොමැති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබාගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

4. අයදුම් කිරීමේ ක්‍රමය

I අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකපත්‍රවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය
(2) ජාතික හැඳුනුම්පතේ පිටපත
(3) මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි
(4) වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි
(5) තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය

II මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

III අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවා ගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය/ තීරණය කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

IV අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහල කෙලවරේ අයදුම්පත් යොමු කරන තනතුර, *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. අසම්පූර්ණ හා 04 ඡේදය යටතේ සඳහන් සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

V දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එන්. ඩී. අයි. ස්වර්ණා කේ. පෙරේරා,
ලේකම්,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් 24 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව,
පානදුර පාර,
බණ්ඩාරගම.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව***

.................................................................................. *තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————.
2. (මුලකුරුවලින් හැඳින්වෙන නම්) :————————.
3. ස්ථිර ලිපිනය :————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
5. උපන් දිනය : වර්ෂය :———— මාසය :———— දිනය :————
6. අයදුම්පත් භාර ගන්නා 2017.12.08 දිනට වයස : අවු. :———— මාස :———— දින :————
7. ස්ත්‍රී / පුරුෂ භාවය :————————.
8. විවාහක / අවිවාහක බව :————————.
9. ජාතිය :————————.
10. ඔබ දැනටමත් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් දරන තනතුර, සේවා කාලය, එම පත්වීම ස්ථිර ද/ තාවකාලික ද/ අනියම් ද/ කොන්ත්‍රාත් ද යන වග :————————.:

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන් ද යන වග :————————————.

12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය) :————————————.

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————————.

————————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————————.

**දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන ............................................................ මහතා / මහත්මිය / මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ / (ස්ථිර / අනියම් / ආදේශක / කොන්ත්‍රාත්) පදනම මත ...................................... කු වශයෙන් සේවය කරයි. ඔහු / ඇය අයදුම් කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් නිදහස් කළ හැක / නොහැක. ඔහු / ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

.......................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————————.
තනතුර :————————————.
දෙපාර්තමේන්තුව :————————————.
නිල මුද්‍රාව :————————————.
දිනය :————————————.

-